අ.පො.ස. උසස් පෙළ

13 ශ්‍රේණිය

# සිංහල I

**කාලය පැය තුනයි.**

Channel NIE

**පිළිතුරු සඳහා මග පෙන්වීම**

1. (අ) (i) දැන් ඔබ දඹදිව පුරා ඇවිද වාද කිරීමට සමත් කෙනෙකු සොයා බලන්න.

(ii) දඹ අතු මලානික වන තුරුත් කිසිවකු ඇය සමග වාද කිරීමට නොපැමිණි නිසා.

(iii) ඔබ සමග වාද කළ හැකි වූයේ නම් එම තැනැත්තාගේ පාදපරිචාරිකාව/භාර්යාව වන්න.

(iv) දුරේදී ම බිය වී/බියට පත් ව

(ලකුණු 01 x 4 = 04යි)

(ආ) (i) යහළුවා (අනුරුද්ධ කුමාරයා) මහණ වීමට යන බව ප්‍රකාශ කිරීම නිසා

(ii) යොවුන් වියේ පසුවීමත් කාමසුව අනුභවයට ඇති කැමැත්තත් නිසා

(iii) පර්වතයක ගැටුණාක් මෙන් රාජ්‍ය පිළිබඳ ආශාවෙන් කම්පාවෙන් යුත් සිතින් යුතු ව

(iv) අමෘත ජල සමූහයකින්/අමා දිය දහරාවකින්/අමෘත ජල ධාරාවකින්

(ලකුණු 01 x4 = 04යි)

(ඉ) (i) පති භක්තියෙන් යුත් ඇගේ (කිඳුරියගේ) සෝ ගින්න නිසා

(ii) මිනිසුන් වාසය කරන තැන වාසය නොකරන ලෙස

(iii) මාගේ ප්‍රිය ස්වාමියාගේ ශරීරයෙහි අමෘතය/අමාදිය ඉස සුවපත් කොට

(iv) තනිකම්/හුදකලාබව

(ලකුණු 01 x 4 = 04යි)

(ඊ) (i) පොරවා ගෙන සිටි පළස මඳක් ඉවත් කොට ශරීර ප්‍රභාව විහිදුවාලීම

(ii) කාමයෙන් උමතු වී දැඩි ශෝකයෙන් දැවී ගිය ශරීරයෙන් යුතු ව උණුසුම් ආශ්වාස ප්‍රශ්වාස වායුව පිරුණු මුව හා නැහැයෙන් යුක්ත ව කඳුලෙන් පිරි නෙත්වලින් යුතු ව සිහි නැති තත්ත්වයට පත්වීම

(iii) සුදු වූ ද සිනිඳු වූ ද දත්පෙළෙහි සිත් ගන්නා සුදු රශ්මියෙන් වෙනස් වූ පැහැය ගත්

(iv) තොල් දෙක/ දෙතොල

(ලකුණු 01 x 4 = 04යි)

(උ) (i) දොම්නස දුරු වී සතුට ඇති වීම

(ii) අසුරයන් පරදවා ජයගත් දිව්‍ය සේනාව පැවැත්වූ සැනකෙළි (උත්සව) මෙන්

(iii) කැමති නොයෙක් වෙස් හොඳින් රඟෙන

(iv) තූර්ය නාදයෙන්/තූර්ය ඝෝෂාවෙන්/තූර්ය රාවයෙන්

(ලකුණු 01 x 4 = 04යි)

(ඌ) (i) ධර්මසේන හිමියන් විසින් රචනා කරන ලද සද්ධර්මරත්නාවලියේ එන කුණ්ඩල කේසී වස්තුවෙන් උපුටාගත් පාඨයකි. බාරයක් ඔප්පු කිරීමට ඇති බව පවසා සිටු දියණියන් පර්වතයට කැටුව ගොස් ඇය මරා ආභරණ පැහැර ගැනීමට කැටුව ආ බව සොරා ප්‍රකාශ කළ අවස්ථාවේ උපායශීලී වූ සිටු දියණියන් සොරා අමතා කළ ප්‍රකාශයකි.

(ii) මයුරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමියන් විසින් රචනා කරන ලද පූජාවලියෙන් උපුටාගත් පාඨයකි. සාකේත නුවර ශිර්ෂාබාධයෙන් පෙළුණු සිටුදේවියට ප්‍රතිකාර කිරීමේ දී බිම වැටුණු තෙල් ස්වල්පය පුලුන් කැබැල්ලක දවටා තබන ලෙස සිටුදේවිය දුන් විධානය දැක කලකිරීමට පත් ව ජීවක කළ ප්‍රකාශයට පිළිතුරු වශයෙන් සිටුදේවිය කළ ප්‍රකාශයකි.

(iii) පන්සිය පනස් ජාතක පොතෙහි එන චුල්ලධනුද්ධර ජාතකයෙන් උපුටාගත් පාඨයකි. කැණහිල් වෙසින් සිටි සක්දෙවිඳුට මත්ස්‍යයා ද මස් කැබැල්ල ද අහිමි වූ ආකාරය දැක සිනාසුණු ස්ත්‍රියට සක්දෙවිඳු එම ස්ත්‍රිය පෙර කළ නොපනත්කම ගැන නින්දා කළ කල්හි ස්ත්‍රිය විසින් සක්දෙවිඳු අමතා කරන ලද ප්‍රකාශයකි.

(iv) II වන ධර්මකීර්ති හිමියන් විසින් රචිත සද්ධර්මාලංකාරයේ නන්දිවාණිජ වස්තුවෙන් උපුටාගත් පාඨයකි. නන්දිවාණිජ වෙළෙන්දාගේ භාර්යාව ලබා ගැනීමේ අටියෙන් සිව නම් ඇමතියා පරදේශයේ වෙළෙඳාමට ගිය නන්දිවාණිජ වෙළෙඳාණන් මැරීමට කැඳවන ලද යකැදුරන් අමතා කළ ප්‍රකාශයකි.

(v) ලෙනාර්ඩ් වුල්ෆ් විසින් රචිත ඒ.පී. ගුණරත්න විසින් පරිවර්තිත බැද්දේගම නවකතාවෙන් උපුටාගත් පාඨයකි. පුංචි මැණිකා විවාහ කර ගැනීමේ අදහස ගැන බබුන් සිලිඳුට පවසන අවස්ථාවේ සිලිඳු බබුන් අමතා කළ ප්‍රකාශයකි.

(vi) ලියනගේ අමරකීර්ති විසින් රචිත 'හැත්තෑ ලක්ෂයෙන් එකෙක්' කෙටිකතාවෙන් උපුටාගත් පාඨයකි. දවසේ වැඩ නිමා කොට බීමත් ව සාඩිං ටින් එකක් ද රැගෙන නිවසට පැමිණි පිලෝරිස් එය පිසීමට බිරිඳට උදව් කරන අතර තුර කුස්සියට පැමිණි දියණියන් අමතා කළ ප්‍රකාශයකි.

(vii) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර විසින් රචිත 'පෙමතො ජායතී සොකො' නාට්‍යයේ ශිල්ප ඉගැන්වීමට සහ රාජ්‍ය සේවයට නොගොස් සිටීමේ අනතුරුදායක තත්ත්වය ගැන ස්වර්ණතිලකා කළ දැනුවත් කිරීමට පිළිතුරු වශයෙන් උද්දාල බමුණා කළ ප්‍රකාශයකි.

(ලකුණු 03 x4 = 12යි)

(ළ) මෙම පද්‍ය නිර්මාණයට වස්තු විෂයය වන්නේ තමා හැර යන පෙම්වතා පිළිබඳ පෙම්වතියගේ සිතෙහි නැගෙන සිතුවිලි සමුදායකි. පෙම්වතාගේ විරහවෙන් කිසිදු ආකාරයකින් ඇ කම්පාවට පත් නොවෙයි. ඔහු කෙරෙහි ද්වේශයක් ද ඇතිකර නොගනියි. ඇ අභීතව ධෛර්ය සම්පන්නව ජීවිතයට මුහුණ දෙන්නට තීරණය කර ගනියි. ව්‍යංගාර්ථවත් බස්වහරක් උපයුක්ත කර ගනිමින් උචිත සංකේත ද භාවිත කරමින් රසිකයා වෙත ප්‍රේම වියෝව පිළිබඳ සුලබ අද්දැකීම අපූර්වත්වයෙන් යුතු ව සංයමයෙන් යුක්ත ව ඉදිරිපත් කිරීමට කවියා ප්‍රයන්ත දරයි.

භාෂාව යොදා ගැනීම

- සූරලා ගෙන යන්න මා හදේ පිපුණ මල්
- මල් නගන වසන්තය ඔබට ගෙන යා හැකි ද?
- ඔබේ නම අදින් පසු තවත් මට අයිති නෑ
- ඔබ යන්න මධුරතර සප්ත ස්වරයත් අරන්<br>ඔබේ රථ මැදිරියට මගේ ඉර - හඳ අරන්
- දේදුන්න පායාවි හෙටත් පාලම උඩින්
- වෙස්මුහුණ පැලඳගෙන සිටින තැන හිතක් නැත
- නිල්ගුවන් ගැබ වදන කුරුල්ලකු පරිද්දෙන්
- එදා ඔබ ගෙයි මුල්ලෙ - සොයාගත් මං දිනුම්
- ආදරය නින්දක් ද පිබිදිලා සිටින මට
- තව බොහෝ දේ තිබේ - ජීවිතේ ජය ගනිමි

මෙවැනි භාෂා විශේෂතා දක්වමින් පිළිතුර ගොනු කර තිබීම අවශ්‍ය ය.

(ලකුණු 12යි )

2. සද්ධර්මරත්නාවලි කතුවරයා සිය කථාවල එන මුඛ්‍ය චරිත ඉස්මතු කිරීම සඳහා සෙසු චරිත උපයෝගී කර ගන්නා ආකාරය නිර්දිෂ්ට කථා ඇසුරෙන් නිදසුන් සහිත ව විස්තර කර තිබීම අවශ්‍ය වේ.

**මට්ටකුණ්ඩලී කථා වස්තුව**

අදින්නපුබ්බක බමුණාගේ චරිතය

- මට්ටකුණ්ඩලීට කුණ්ඩලාභරණයක් සකස් කර දෙන අවස්ථාව
- මට්ටකුණ්ඩලීගේ අසනීප තත්ත්වය ගැන මවු බැමිණිය බමුණා දැනුවත් කරන අවස්ථාව
- මට්ටකුණ්ඩලීගේ අසනීපයට ප්‍රතිකාර කරන ආකාරය
- රෝගය උත්සන්න වූ අවස්ථාවේ වස්තු තණ්හාවෙන් කටයුතු කරන ආකාරය
- මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයා හමු වුණු අවස්ථාවේ ක්‍රියාකරන ආකාරය

**කුණ්ඩලකේසීගේ වස්තුව**

කුණ්ඩලකේසී සිටුදුවණියගේ චරිතය

- සොරා සමඟ විවාහය අපේක්ෂාවෙන් සිටි දියණිය හමුවේ දෙමවුපියන් හැසුරුණු ආකාරය
- සොරාගේ ව්‍යාජ හැසිරීම් හමුවේ ඇයගේ සිත ක්‍රියාකරන ආකාරය
- ස්වාමියාගෙන් අනතුරක් වන බව දැන ඇය හැසිරෙන ආකාරය
- සොරාගේ ක්‍රියාකලාපය මත ඇගේ අනාගත ජීවිතය තීරණය වන ආකාරය

**නැතහොත්**

ජාතක කථා රචකයා සංකීර්ණ අවස්ථාවන් හි දී පුද්ගල චරිත හැසිරෙන ආකාරය තාත්වික ව නිරූපණය කිරීම සඳහා දැක්වූ කුසලතාව නිර්දිෂ්ට කථා දෙක ආශ්‍රයෙන් නිදර්ශන සහිත ව විස්තර කර කිරීම අපේක්ෂිත ය.

**චුල්ලධනුද්ධර ජාතකය**

- කුමාරයා අභිමානයෙන් ක්‍රියාකරන අවස්ථා
- ජාතක කථාවේ සඳහන් ස්ත්‍රිය කුමාරයා සහ සොරදෙටුවා අතර ඇතිවන ගැටුමේ දී ක්‍රියාකරන ආකාරය
- ස්වාමියා අහිමි වූ අවස්ථාවේ ස්ත්‍රිය කටයුතු කරන ආකාරය
- සොරදෙටුවා ස්ත්‍රිය සම්බන්ධයෙන් ක්‍රියාකරන ආකාරය

**චන්දකින්නර ජාතකය**

- බරණැස් රජු සඳකිඳුරිය කෙරෙහි සිත්බැඳී කටයුතු කරන ආකාරය
- සඳකිඳුරිය රජතුමාට දෝෂාරෝපණය කරන අවස්ථාව
- කිඳුරා මියගියේ යැයි සිතා කිඳුරිය ශෝකයෙන් හැසිරෙන ආකාරය
- සැමියා ජීවත්වන බව දැන දෙවියන්ට උජ්ඣායනා කිරීම

(ලකුණු 15යි)

3. සදාචාරසම්පන්න සමාජ පැවැත්මකට ඉවහල් වන සදුපදේශ (යහපත් උපදෙස්) කථා රසයෙන් යුතු ව ඉදිරිපත් කිරීමට සද්ධර්මාලංකාර කතුවරයා දරන ප්‍රයත්නය සාර්ථක වී ඇත් ද යන්න නිර්දිෂ්ට කථා ඇසුරෙන් පැහැදිලි කර තිබීම අවශ්‍ය ය.

**ස්වර්ණතිලකා වස්තුව**

- අතීත කතාවේ ස්ත්‍රිය මලස්න හා අත් නොසෝදා දාගැබට මල් පිදීම ගැන දියණියට දොස් පැවරීම
- දියණියන් එම සිදුවීමෙන් අනතුරුව මවට කළ අපවාදය හේතුවෙන් පසු ආත්මභවයේ දී චණ්ඩාල කුලයක ඉපදීම
- මල් පිදීමෙන් අනතුරුව කළ ප්‍රාර්ථනයට අනුව පසු භවයේ දී අතිශයින් ම රූමත් ව ඉපදීම

- ස්ත්‍රීලෝලත්වය හා කාමුකභාවය නිසා රජවරුන් මෙන් ම උද්දාල බමුණා ද විනාශයට පත් වීම
- ලෞකික සුවය පතා කරන ප්‍රාර්ථනාවන්ගේ නිෂ්ඵලභාවය හා ලොවුතුරා සුවය ම පතා කටයුතු කිරීමේ යහපත අවධාරණය කිරීම

**නන්දිවාණිජ වස්තුව**

- අනුන්ගේ භාර්යාවන් කෙරෙහි කාමාශාවෙන් කටයුතු කිරීම නිසා සිදු වන ව්‍යසනය
- වෙළෙඳ භාර්යාවගේ පති භක්තිය නිරූපණය වීම
- රූපයෙහි නිසරු බව දැක්වීම
- ශිව ඇමැතියා අනුන් විනාශ කිරීමට ගොස් තමන් ම විනාශයට පත් වීම
- තමන් විනාශ කිරීමට පැමිණෙන්නන්ට පවා මෛත්‍රිය වැඩීම නිසා වෙළෙන්දා සහ ඔහුගේ පිරිස නිරුපද්‍රෑත වීම
- අකාලයේ මිය ගිය සතුරාට පවා දයානුකම්පාවෙන් පින්පෙත් පැමිණවීම
- කාමරාගය දුරු කොට ස්වල්ප මාත්‍ර වූ හෝ කුසලයක් කිරීමේ ආනිසංස පහදා දීම

**නැතහොත්**

අභව්‍ය සේ පෙනී යන සිදුවීම් පවා විශ්වසනීයත්වයෙන් යුතු ව කතා රසය දනවන පරිදි විවරණය කෙරෙන අවස්ථා පූජාවලියෙහි දැක්වෙන නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් නිදසුන් සහිත ව විමර්ශනාත්මක පැහැදිලි කිරීම අපේක්ෂා කෙරේ.

**අනුරුද්ධ කුමාර කථාව**

- නුවරට අරක්ගත් දේවතාව තලියෙහි සුවඳ කැවුම් මවාලීම
- නැතැයි යන බසෙහි අර්ථය නොදැන පින් බලයෙන් වැඩීම
- අපායගාමී ව විඳින දුක් ද දිව්‍ය ලෝකවල විඳින සැප ද සංසන්දනාත්මක ව දැක්වීම
- අප්‍රමාණ සැප සම්පත් හැර ක්ෂණික ව මහණ වීමට තීරණය කිරීම

**ජීවක වෛද්‍යවරයාගේ කථාව**

- ශක්‍රයාගේ අනුභාවයෙන් ජීවක වෛද්‍ය ශාස්ත්‍රය ප්‍රගුණ කිරීම
- විවිධ රෝගාබාධ සඳහා පිළියම් කිරීමේ දී ජීවක විශේෂ හැකියාවන් පෙන්නුම් කිරීම
- චණ්ඩප්‍රද්‍යෝත රජුගේ උපත සිදු වූ ආකාරය
- රජුගේ දිව්‍ය සමාන වාහනවල බලය වර්ණනා කර ඇති අයුරු

(ලකුණු 15යි)

4. (අ) කෝට්ටේ යුගය සිංහල පද්‍ය සාහිත්‍යය, වස්තු විෂයය සම්බන්ධයෙන් දක්වන විවිධත්වය උදාහරණ දක්වමින් විස්තර කර තිබීම අපෙක්ෂිත ය.

- ජාතක කථා පද්‍යයට නැගීම
  සත්තුභක්ත ජාතකය ඇසුරෙන් කාව්‍යශේඛරය ලිවීම
  ගුත්තිල ජාතකය ඇසුරෙන් ගුත්තිල කාව්‍යය ලිවීම
  කාව්‍යශේඛරය මහා කාව්‍යයක් හා ගුත්තිලය ඛණ්ඩ කාව්‍යයක් ලෙස සැලකීම
- සන්දේශ කාව්‍ය රචනා වීම
  (පරෙවි සන්දේශය, ගිරා සන්දේශය, සැළලිහිණි සන්දේශය, හංස සන්දේශය හා කෝකිල සන්දේශය)
- උපදේශ කාව්‍ය - ලෝවැඩ සඟරාව
- බුදුගුණ කාව්‍ය - බුදුගුණ අලංකාරය
- ප්‍රශස්ති කාව්‍ය - පැරකුම්බා සිරිත
  ආදි වස්තු විෂයයන්ගෙන් උදාහරණ දැක්වීම අවශ්‍ය වේ. (ලකුණු 07යි)

(ආ) ගුත්තිල කාව්‍යයෙහි ඇතුළත් සුරඟන රැඟුම මගින් වැත්තෑවේ හිමියන් සතු විශිෂ්ට කවිත්වය පිළිබිඹු කරන ආකාරය නිදසුන් මගින් විස්තර කර තිබීම මෙහි දී අපේක්ෂා කෙරේ.

සරල සුගම බස් වහර

උචිත කාව්‍යාලංකාර භාවිතය

සංකල්ප රූප මැවීම

පද සංඝටනය

නර්තනයට උචිත විරිත

එළිසමය, විරිත, අනුප්‍රාසය ආදි ශබ්දාලංකාර උපයුක්ත කර ගැනීම වැනි ලක්ෂණ දක්වමින් විස්තර කිරීම අවශ්‍ය වේ.

(ලකුණු 08යි)

5. දරිද්‍රතාවෙන් හා නූගත්කමින් මිරිකී සිටින ජනයා බලවතුන්ගේ පීඩනයෙන් ද අසරණභාවයට පත් වන අයුරු බැද්දේගම නවකතාවෙන් නිරූපණය වන ආකාරය නිදසුන් සහිත ව විස්තර කිරීම අපේක්ෂා කෙරේ.

- තහනම් ක්‍රියා ලෙස සැලකුණු ගසක් කැපීම හා හේනක් එළි කිරීම සඳහා ආරච්චිගෙන් අවසර ලබා ගැනීමට සිදු වීම නිසා ආරච්චිගෙන් ගම්මුන් පීඩාවට පත් වීම
- ආරච්චි හා වෙදරාළ වැනි ගමේ බලවතුන්ගේ අමානුෂික ක්‍රියා නිසා හින්නිහාමි මරණයට පත් වීම
- වගාවක් සඳහා හේන් බලපත්‍ර ලබා දීමේ දී ආරච්චිගේ ක්‍රියාකලාපය නිසා ගම්මුන් අසාධාරණයට ලක් වීම
- ආරච්චි හා ප්‍රනාන්දු මුදලාලි එක් ව බබුන් බොරු නඩුවකට පටලවා සිරගත කිරීම
- පුංචි මැණිකා නතු කර ගැනීමට ප්‍රනාන්දු මුදලාලි ගන්නා ප්‍රයත්නයට ගමේ ප්‍රධානියා වන ආරච්චිලගේ සහාය ලැබීම
  ආදි උචිත නිදසුන් දැක්වීම අවශ්‍ය වේ. (ලකුණු 15යි)

6. ආර්ථික දුෂ්කරතා ද විරැකියාව ද හේතුකොට ගෙන පීඩනයට පත් වන ජන ජීවිතයේ යථා ස්වභාවය කලාත්මක අයුරින් ප්‍රතිනිර්මාණය කෙරෙන කෙටිකතා කිහිපයක් ම නිර්දිෂ්ට කෙටි කතා අතර වේ.

- ජයතිලක කම්මැල්ලවීරගේ 'කළු සපත්තු' කෙටිකතාවෙහි උගත්කමට සරිලන රැකියාවක් නොලබන සිරිදාස තමාට නොගැළපෙන රැකියාවක් ලැබ අපහසුතාවන්ට මුහුණ දීම
- දයාසේන ගුණසිංහගේ 'කපිතන්ගේ පුත්තු' කෙටිකතාවෙහි ආර්ථික දුෂ්කරතා හා රැකියා විරහිතභාවය හේතුකොට ගෙන අරගලයට යොමු වී ජීවිතවලින් වන්දි ගෙවීම
- ඒ.වී. සුරවීරගේ 'අකුරට යන වෙලාවේ' කෙටිකතාවෙහි ආර්ථික පීඩනය නිසා ඉගෙනීමේ දක්ෂ දැරියක මෙහෙකාරකමට යැවීමට දෙමාපියන්ට සිදුවීම
- ලියනගේ අමරකීර්තිගේ 'හැත්තෑලක්ෂයෙන් එකෙක්' කෙටිකතාවේ පොල් කැඩීමෙන් ජීවත් වන පිලෝරිස් ද හරිහමන් රැකියාවක් නැති ව හොරකමට හසු වූ පුතු ද පීඩනයට පත් වීම

ආදි උචිත කෙටිකතා තුනක් මගින් නිදසුන් දක්වා තිබීම අපේක්ෂා කෙරේ

(ලකුණු 15යි)

7. මවුපියන් හා දූ දරුවන් අතර පවත්නා සාධනීය බැඳීම අපූර්වත්වයෙන් යුක්ත ව විදහා දැක්වීමට නූතන කවීන් ගන්නා ප්‍රයත්නයේ සාර්ථකත්වය විමසීම මේ ප්‍රශ්නය මගින් අපේක්ෂා කෙරේ.

- නැළවිල්ල - කුමාරතුංග මුනිදාස
- රන්තැටියක කඳුළු - දයාසේන ගුණසිංහ
- පොඩි දුව - මොනිකා රුවන්පතිරණ
- දුරු රට ගිය පුතු - බුද්ධදාස ගලප්පත්ති

යන කාව්‍ය නිර්මාණවලින් තුනක් ඇසුරෙන් නිදසුන් දක්වමින් පිළිතුරු ඉදිරිපත් කර තිබිය යුතු ය.

(ලකුණු 15යි)

8. ජීවිත අභියෝගවලට මුහුණ දෙන පුද්ගල චරිතවල සියුම් මනෝභාව යථාර්ථවත් ලෙස නිරූපණය කිරීමෙහි ලා එදිරිවීර සරත්චන්ද්‍රයන් සමත් වන්නේ ද යන්න පෙමතො ජායතී සොකො නාට්‍ය පෙළ ඇසුරෙන් විමර්ශනාත්මක ව බැලීම මෙහි දී අපේක්ෂා කෙරේ.

- ස්වර්ණතිලකා මුල්වරට දැකීමෙන් උද්දාල බමුණා වික්ෂිප්තභාවයට පැමිණීම
- උද්දාල විසින් ස්ත්‍රීන් දැකීම පිළිකුල් කටයුත්තක් ලෙස සිතීම
- සිසුන්ගෙන් තක්සලාවට පිවිසෙන්නට ඉඩ නොලද සැඩොල් බමුණා හා ස්වර්ණතිලකා කෙරෙහි උද්දාල බමුණා සානුකම්පික වීම
- සිසුන් ගුරුවරයා කෙරෙහි දක්වන ගරුසරුභාවය
- උද්දාල බමුණා හා ස්වර්ණතිලකා ඔවුනොවුන් කෙරෙහි දක්වන ප්‍රේමය
- ගුරුවරයා ස්ත්‍රියකට වසඟ වී තමන් නොසලකා හැරීම පිළිබඳ ශිෂ්‍යයන් තුළ ඇතිවන නොසතුට
- ස්වර්ණතිලකාගේ වසඟයෙන් ගුරුතුමා ගලවා ගැනීමට සිසුන් කෲරත්වයෙන් කටයුතු කිරීම

ආදි නිදසුන් මගින් පිළිතුර ගොඩ නගා තිබිය යුතු ය.

(ලකුණු 15යි)

පිළිතුරු සඳහා මග පෙන්වීම

## I කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| 01 | 2 | 11 | 4 |
| 02 | 3 | 12 | 3 |
| 03 | 2 | 13 | 1 |
| 04 | 1 | 14 | 4 |
| 05 | 4 | 15 | 5 |
| 06 | 1 | 16 | 2 |
| 07 | 3 | 17 | 3 |
| 08 | 2 | 18 | 4 |
| 09 | 1 | 19 | 1 |
| 10 | 5 | 20 | 5 |

## II කොටස

2 (අ) (i) වෙනස් වීම

(ii) යම් ප්‍රදේශයක් තුළ හෝ කොටසක් තුළ හෝ සිටින සාමාජිකයන්ට පොදු වූ ලක්ෂණ සැහෙන ගණනකින් සමන්විත වන ප්‍රදේශීය/සමාජඛණ්ඩයේ ව්‍යවහාරය ලෙස,

(iii) එම උපභාෂාව වටහා ගැනීම අපහසු වන තරමට වෙනස්කම් වර්ධනය වූ විට

(iv) පුද්ගල භාෂණයත් භාෂාවත් යන දෙකෙහි අතරමැදියකු ලෙස ක්‍රියාකිරීම

(v) භූගෝලීය දූරස්ථභාවය
සමාජීය දූරස්ථභාවය
ආකල්පමය වශයෙන් ඇති වෙනස්කම්
සංස්කෘතික සංස්පර්ශයන්ගේ විවිධත්වය
(කරුණු දෙකක් ලිවීම ප්‍රමාණවත් ය)

(vi) භාෂක සමාජය සැතපුම් සියදහස් ගණනක් විශාල භූමි ප්‍රදේශයක් පුරා විහිදී යෑම

(ලකුණු 02 × 6 = 12යි)

2 (ආ)

* ඉංග්‍රීසි භාෂාවේ ප්‍රභවය ක්‍රිස්තු වර්ෂ 5-7 සියවස් අතරට අයත් ය.
* දකුණු ආසියානු භාෂා වන හින්දී බස 7 වන සියවසට ද බෙංගාලි බස 10-12 සියවස් අතරට ද ගැනේ.
* රුසියානු බසෙහි ආරම්භක අවධිය 14 වන (තුදුස් වන) සියවස යි.
* සිංහලයේ ආදිතම ලේඛන ද සාහිත්‍යය ද ක්‍රිස්තු පූර්ව 3-2 සියවස් අතරට ගැනෙයි.
* 6-7 සියවස්වලට අයත් සීගිරි ගීවලින් සිංහලයේ දියුණු සාහිත්‍යයක් පැවති බව පෙනේ.
* 9-10 සියවස්වල බිහි වුණ සිංහල කෘති අනුව සංස්කෘත හා පාළි භාෂා සමග සම කළ හැකි මට්ටමේ සාහිත්‍යයක් සිංහලයේ ද පැවතිණි.

ඉහත කරුණු ඇතුළත් ව ලේඛන ව්‍යවහාරයෙන් සාරාංශය ලියා තිබිය යුතු ය. සාරාංශය එක් ඡේදයක් ලෙස ලියා තිබිය යුතු අතර ඡේදවලට බෙදා ඇත්නම් සමස්තයෙන් ලකුණු 02ක් අඩු කෙරේ. වචන සංඛ්‍යාව 50-60 අතර තිබීම අවශ්‍ය ය. එම ප්‍රමාණය අඩු හෝ වැඩි වේ නම් ලකුණු 03ක් අඩු වේ.

| | |
|---|---|
| සාරාංශයේ නියමිත වචන ප්‍රමාණයට | ලකුණු 02යි |
| අක්ෂර වින්‍යාසයට | ලකුණු 03යි |
| අන්තර්ගතයට | ලකුණු 08යි |

(ලකුණු 13යි)

3 වාක්‍ය රචනයට ලකුණු ලබා දීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කෙරේ.

(i) තෝරාගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ගොනු කිරීම
(ii) කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම
(iii) කරුණුවල පැහැදිලි බව
(iv) නිවැරදි අක්ෂර වින්‍යාසය
(v) ව්‍යාකරණ දෝෂ රහිත වීම
(vi) ව්‍යක්ත භාෂා හැසිරවීම
(vii) පද බෙදීම හා ඡේද වෙන් කිරීම
(viii) අත් අකුරු පැහැදිලි වීම

වචන සංඛ්‍යාව 300-350 අතර වීම අවශ්‍ය ය.
වචන 400ට වැඩි නම් හෝ 250ට අඩු නම් හෝ ලකුණු 03ක් අඩු වේ.

(ලකුණු 25යි)

4 (අ) (i) ආරක්ෂක හමුදාවල සෙබළියෝ ද ඇත.
(ii) නිවැරදි වාක්‍යයකි.
(iii) සේවකයන් පැමිණියහොත් අපි කර්මාන්තශාලාවේ වැඩ ආරම්භ කරමු.
(iv) රියැදුරන් විසින් මගීහු බස් රථයට නංවා ගන්නා ලදහ/ ලද්දාහු ය/ ලද්දෝ ය/ නංවා ගනු ලැබූහ/ ලැබුවෝ ය/ නංවා ගැනුණු/ ගැනුණාහ
(v) රාජ්‍ය නිලධාරීන් හෙට සේවය සඳහා වාර්තා කරාවි. (ලකුණු 01 x 5 = 05යි)

(ආ)(i) අප විසින් උදෑසනින් ම සියලු දරුවෝ සැණකෙළි භූමියට කැඳවා ගෙන යනු ලැබූහ/ලැබුවෝ ය/ යන ලදහ/ ලද්දෝ ය.

(ii) කර්මාන්ත ශාලා හිමියන් විසින් වර්ෂාවසානයේ දී සේවකයන්ට ප්‍රසාද දීමනා පිරිනමනු ලැබේ/ ලබයි/ලැබෙයි/පිරිනැමේ/පිරිනැමෙයි.

(iii) රාජ්‍ය නායකයා විසින් විදේශීය රාජ්‍යතාන්ත්‍රිකයෝ බුහුමන් සහිත ව පිළිගැනුණාහ/පිළිගනු ලැබූහ/පිළිගනු ලැබුවෝ ය/පිළිගන්නා ලදහ/ලද්දෝ ය.

(iv) පොදු රාජ්‍ය මණ්ඩලීය තරග ජයග්‍රාහිකාහිකාවක විසින් සිය පුහුණුකරුට ප්‍රණාමය පුද කෙරිණි/ කෙරිණ/ පුද කරනු ලැබිණ/ කරනු ලැබී ය/ ලැබුවේ ය/ පුද කරන ලදි/ ලද්දේ ය.

(v) වාදක කණ්ඩායම විසින් මියුරු සරින් ප්‍රේක්ෂකයෝ පිනවෙති/පිනවනු ලබති/ලබත්.

(ලකුණු 01 x 5 =05යි)

(ඉ) (i) කවියකු - රචකයෙක්

(ii) දරුවන් - දෙමාපියෝ

(iii) අයෙක් - විය

(iv) ශිල්පීන් - අපි

(v) පාලකයෝ - පුරවැසියන්

(ලකුණු 01 x 5 =05යි)

5.

| | වචනය | ව්‍යාකරණ අංගය | අනු අංගය |
|---|---|---|---|
| (i) | **චිරන්තන**<br>**නිර්මාණයන්හි**<br>**උපදේශාර්ථ** | තද්ධිත<br>විභක්ති<br>සන්ධි | සම්බන්ධාර්ථයෙහි තද්ධිත<br>ආධාර විභක්ති/ අදර විබත්<br>ස්වර්ණ ස්වර දීර්ඝ/සමාන ස්වර දීර්ඝ/ ස්වර දීර්ඝ/දීර්ඝ ස්වරාදේශ |
| (ii) | **මවුපියෝ**<br>**උදෙසා**<br>**උසුලති** | සමාස<br>නිපාත<br>ක්‍රියා පද | ද කාරාර්ථ සමාසය/ ද අරුත් සමස්<br>පිණිසාර්ථයේ නිපාත<br>ත්‍රෛකාලික ක්‍රියා/තෙකල් කිරිය/ශුද්ධ ක්‍රියා/අවසාන ක්‍රියා |
| (iii) | **උපසභාපතිවරයා**<br>**දැක්වූ**<br>**ම** | සමාස<br>කෘදන්ත<br>නිපාත | අව්‍යය සමාස/ අවිය සමස්<br>අතීත කෘදන්ත/ අතීත කාල කර්තෘකාරක කෘදන්ත<br>අවධාරණාර්ථයේ නිපාත/ අවධාරණ අර්ථය |
| (iv) | **දක්ෂ**<br>**සුමියුරු**<br><br>**ප්‍රබෝධවත්** | විශේෂණ<br>උපසර්ග<br><br>තද්ධිත | නාම විශේෂණ<br>භූෂණාර්ථයේ උපසර්ග/අර්ථය තීව්‍ර/ වැඩි කිරීමේ උපසර්ග/වඩා, අධික යන අර්ථයේ උපසර්ග<br>අස්ථ්‍යර්ථයේ තද්ධිත/ඇත යන අර්ථයේ තද්ධිත |
| (v) | **සිටිද්දී**<br><br>**ගංවතුර**<br>**තෙක්** | අසම්භාව්‍ය ක්‍රියා<br><br>සන්ධි<br>නිපාත | කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා<br><br>ගාත්‍රාක්ෂර ලෝප සන්ධි/ගතකුරුලොප්සඳ<br>සීමාර්ථයේ නිපාත/අපර සීමාව දැක්වීමේ නිපාත |

(ලකුණු (01 x 3) x 5 =15යි)

6. (අ) (i) මනුෂ්‍ය (ii) මහා
(iii) යොවුන් (iv) මහ
(v) මිනිස් (vi) යෞවන

(ලකුණු ½ x 6 = 03යි)

(ආ) අද අපට **කුසගින්නේ නොසිට** ජීවත් වීමට **හැකි** වුණේ පුරාණ රජවරුන් දුරදිග **බලා** (දූරදර්ශී ව) සෑදූ වැව් අමුණු **නිසා** ය. (ලකුණු ½ x 6 = 03යි)

(ඉ) (i) **ප්‍රතිකාරවලින්** - කරණ විභක්තිය/කරණ විබත්
**සුවය** - කර්ම විභක්තිය/කම් විබත්
(ii) **ගසේ** - සම්බන්ධ විභක්තිය/සබඳ විබත්
**දේ** - ප්‍රථමා විභක්තිය/පෙර විබත්
(iii) **අසුනෙන්** - අවධි විභක්තිය/අවදි විබත්
**මවකට** - සම්ප්‍රදාන විභක්තිය/සපදන් විබත් (ලකුණු ½ x 6 = 03යි)

(ඊ) ඔබ දක්ෂ පාලකයෙකි; දේශ හිතෛෂියෙකි; කුලුණෙන් තෙත් වූ හද ඇත්තෙකි. නියමුවාණනි, රටට අවශ්‍ය ම මොහොතෙහි අප හැර ගියේ ඇයි? එම වියෝව දරා ගත නොහැකි ය. මතු භවයේ දිත් ඔබ මේ දේශයෙහි ම ඉපිදේවා! (ලකුණු ½ x 6 = 03යි)

(උ) (i) තමන් තරගයෙන් අනිවාර්යයෙන් ජය ලබන බව ඔවුහු පැවසූහ.
(ii) තරුණතරුණියන් ශ්‍රමදානයට මහත් උනන්දුවෙන් සහභාගි වූ බව ගම්වැසියෙක් කීවේ ය.
(iii) රට ගොඩනගන්නට උදවු කරන ලෙස නායකයා පුරවැසියන්ගෙන් ඉල්ලා සිටියේ ය.

(ලකුණු ½ x 6 = 03යි)

07. (i) කොබෝලීල, දෑසමන්, නා, පුවඟු, සපු, සල්, සෙව්වන්දි (මෙහි වචනයක් හෝ අඩු නම් හෝ එක් වචනයක හෝ අකාරාදි පිළිවෙළ වැරදි නම් හෝ ලකුණු හිමි නොවේ.)

(ලකුණු 01 x 3 = 03යි)

(ii) කැලගේ - කෙටි ඇදය, කොම්බුව හා දීර්ඝත්ව ලක්ෂණය/ හල් ලකුණ/ හල්පිල්ල
කිතුලිය - කෙටි ඉස්පිල්ල, කෙටි පාපිල්ල, කෙටි ඉස්පිල්ල
ලලනාවෝ - ඇලපිල්ල, කොම්බුව ඇලපිල්ල හා දීර්ඝත්ව ලක්ෂණය/ කොම්බුව හා හල් ඇලපිල්ල (ලකුණු 01 x 3 = 03යි)

(iii) නඳුනුයනට, අනෙකක්, ඔවුනොවුන් (ලකුණු 01 x 3 = 03යි)

(iv) මල් + ඉන්
අනුගමන + එහි
හංස + අකු

(ලකුණු 01 x 3 = 03යි)

(v) ශෝභාවෙන්/ශෝභා (ලකුණු 03යි)

08. (i) ද්විත්ව රූප සන්ධිය

පූර්ව ස්වරය ලොප් කිරීමෙන් පසු ඉතිරි වන ව්‍යංජනය ද්විත්ව කොට සකසා ගන්නා සන්ධිය ද්විත්ව රූප සන්ධිය යි.

උදා: හෙළිලි + අඹු - හෙළිල්ලඹු

තඹපලු + එන් - තඹපල්ලෙන්

නාම පද සෑදීමේ දී ද ද්විත්ව රූපය සිදු වෙයි.

සුදුසු + ඕ - සුදුස්සෝ

ගාලු + අට - ගාල්ලට

ස්වරාරෝහණය නොවූ ව්‍යංජනාක්ෂරය ද ද්විත්ව වෙයි.

පොල් + අත්ත - පොල්ලත්ත

රුක් + අත්තන - රුක්කත්තන

වල් + අම්බලම - වල්ලම්බලම

(ii) භාව කාරක කෘදන්ත

ක්‍රියා මාත්‍රයක් පමණක් හඟවන ප්‍රත්‍යය යෙදීමෙන් සෑදෙන කෘදන්ත භාවකාරක කෘදන්ත නම් වෙයි. භාවාර්ථ කෘදන්ත, භාවක්‍රියා හා හව්කිරිය පද යනුවෙන් ද මේවා හැඳින්වේ. මෙහිලා නු, උම්, ඊම්, ඉලි, මන් ප්‍රත්‍යය යෙදේ.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| උදා: | නු - | කර | + | නු | - | කරනු | (කිරීම) |
| | | නට | + | නු | - | නටනු | (නැටීම) |
| | උම් - | හඟ | + | උම් | - | හැඟුම් | (හැඟීම) |
| | | පුද | + | උම් | - | පිදුම් | (පිදීම) |
| | ඊම් - | කප | + | ඊම් | - | කැපීම් | (කැපීම) |
| | | රක් | + | ඊම් | - | රැකීම් | (රැකීම) |
| | ඉලි - | සනස | + | ඉලි | - | සැනසිලි | (සැනසීම) |
| | | නළව | + | ඉලි | - | නැළවිලි | (නැළවීම) |
| | මන් - | ලිය | + | මන් | - | ලියමන් | (ලිවීම) |
| | | කිය | + | මන් | - | කියමන් | (කීම) |

(iii) අනියමාර්ථ අසම්භාව්‍ය ක්‍රියා

අනියම් බවක් හෙවත් අවිනිශ්චිත භාවයක් පළ කරන්නේ අනියමාර්ථ අසම්භාව්‍ය ක්‍රියා ය. මේ සඳහා ත්, හොත්, ඔත්, හොත, ඕතින්, තොත්, ත ප්‍රත්‍යය යෙදේ.

උදා: ත් - එතකුදු **වුවත්** හිමි - සිල්ප සත්වැනි දවස දක්වමි

හොත් - පුතා **පැමිණිය හොත්** මම ද එන්නෙමි

ඔත් - පුතා **ආවොත්** තාත්තා සතුටු වේවි

ඕතින් - එහෙම **කළෝතින්** හොඳයි

තොත් - එසේ **කරතොත්** යෙහෙකි

ත - **යත** බැරි නොවේ

(iv) ඕෂ්ඨජ අක්ෂර

යටිතොල උඩුතොල හා ස්පර්ශ වීමෙන් උපදින ශබ්ද ඕෂ්ඨජ අක්ෂර නම් වේ.
ස්වර - උ, ඌ
ව්‍යංජන - ප, ඵ, බ, භ, ම, ඹ
මෙම අක්ෂර ඖෂ්ඨජ අක්ෂර නමින් ද හැඳින්වේ.

(v) ගෞරවාර්ථ තද්ධිත ප්‍රත්‍යය

නාම ප්‍රකෘතියකින් පර ව යෙදී ගෞරවාර්ථය පළ කෙරෙන ආණ, අණු, අණි ප්‍රත්‍යය ගෞරවාර්ථ තද්ධිත ප්‍රත්‍යය වේ. මෙහි ආණ, අණු ප්‍රත්‍යය පුරුෂාර්ථයෙහි ද අණි ප්‍රත්‍යය ස්ත්‍රීලිංගාර්ථයෙහි ද යෙදේ.

| | | | |
|---|---|---|---|
| උදා: | ආණ | - පිය + ආණ | - පියාණෝ |
| | | සිටු + ආණ | - සිටාණෝ |
| | අණු | - මල් + අණු | - මලණුවෝ |
| | | පුත් + අණු | - පුතණුවෝ |
| | අණි | - දූ + අණි | - දියණියෝ |
| | | මා + අණි | - මැණියෝ |

(ලකුණු 05 × 3 = 15යි)